# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## පළමු වාර පරීක්ෂණය - 2019

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

11 ශ්‍රේණිය කාලය පැය 02

නම / විභාග අංකය : ..............................................................................................................................

- පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුනු 20 ක්ද අනෙක් සෑම ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

01. ප්‍රදේශයේ සීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු රෝගය මර්දනය කිරීමේ අරමුණින් සංවිධානය කරනු ලැබූ ''ඩෙංගු නසමු - මරු පරදමු'' වැඩසටහකට සහභාගි වූ වෛද්‍යවරිය එහි ආරම්භක දේශනය පවත්වමින් කියා සිටියේ ඩෙංගු රෝග මර්දනයට සියලු දෙනා පෙළ ගැසිය යුතු බවයි.

i. ඉහත සිදුවූ සන්නිවේදනය වර්ගය කුමක්ද?
ii. මෙම සන්නිවේදන වර්ගයේ ලක්ෂණ දෙකක් දක්වන්න.
iii. ඇගේ දේශනය සාර්ථක කර ගැනීමට ඇයට භාවිතා කළ හැකි උපක්‍රම හතරක් දක්වන්න.
iv. දේශනය පවත්වන අවස්ථාවේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියා දක්වන්න.
v. ඉහත අවස්ථාවේදී වෛද්‍යතුමියට භාවිතා කළ හැකි සන්නිවේදන ස්වරූප හතරක් දක්වන්න.
vi. මෙම අවස්ථාව විධිමත් සන්නිවේදන අවස්ථාවක් බවට ඉදිරිපත් කළ හැකි සාධක දෙකක් දක්වන්න.
vii. ඉහත දේශනය මගින් සපුරා ගත හැකි මූලික සන්නිවේදන අරමුණු හතරක් ලියන්න.
viii. මෙම වැඩසටහන පිළිබඳ ප්‍රදේශයේ ජනතාව අතර තොරතුරු ගලා යන්නට ඇතැයි සිතිය හැකි අවිධිමත් සන්නිවේදන දාම දෙකක් නම් කරන්න.
xi. මෙම වැඩසටහන පිළිබඳ තොරතුරු ලබා දුන් විද්‍යුත් මාධ්‍ය දෙකක් නම් කරන්න.
x. විවිධ ජන මාධ්‍ය වලදී ග්‍රාහකයා හඳුන්වන නම් වෙනස් වේ. ඉන් දෙකක් දක්වන්න.

(ලකුණු 2x10)

(02) සමාජීය සත්වයෙකු වන මිනිසාට සන්නිවේදනයෙන් තොරව ජීවත් විය නොහැක. දෛනික ජීවිතයේදී අප සෑම කෙනෙක් ම සන්නිවේදනයේ යෙදෙයි.

i. තාක්ෂණික දියුණුවක් සමඟ වර්තමානයේ සියලු මාධ්‍ය එකට හමුවේ.
මෙය හඳුන්වන නම කුමක් ද? (ල. 01)
ii. ප්‍රාථමික සමාජයේ විසූ මානවයා තොරතුරු හුවමාරු කරගත් සාම්ප්‍රදායික දෘශ්‍ය සන්නිවේදන ක්‍රමෝපායන් හතරක් දක්වන්න. (ල. 02)
iii. ජන සන්නිවේදනයේ විශේෂ ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)
iv. දොරටුපාල සංකල්පය පැහැදිලි කර ජන සන්නිවේදනයේදී එය ක්‍රියාත්මක වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 04)

(03) දුරකථනයෙන් කථා කරන විට කට හඬ දුරකථනයෙන් තරංග බවට පත්කර මුදා හරින අතර එය යළි ග්‍රාහකයාගේ දුරකථනයේදී කටහඬ බවට පත්වී පණිවිඩය සම්ප්‍රේෂණය වේ.

i. දුරකථන ක්‍රියාවලිය හා පදනම් වූ සන්නිවේදන ආකෘතිය හඳුන්වන්න. (ල. 01)
ii. ඉහත ආකෘතිය ඇඳ දක්වන්න. (ල. 02)

iii. ජංගම දුරකථනය මගින් සිදු කළ හැකි සන්නිවේදන වර්ග තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

iv. ඉහත ආකෘතිය හා ලැස්වෙල් ආකෘතිය අතර සමානකම් වෙනස්කම් සන්සන්දනය කරන්න. (ල. 04)

(04) මිතුරෙකුගේ විවාහ මංගල උත්සවයකදී හමුවූ පාසල් මිතුරන් දෙදෙන අතීත මතක ආවර්ජනය කරමින් සාකච්ඡාවක නිරත විය.

i. මෙහිදී සිදුවූ සන්නිවේදන වර්ගය කුමක් ද? (ල. 01)

ii. මෙවැනි අවස්ථාවක භාවිතා විය හැකි නිර්වාචක සන්නිවේදන විධි හතරක් කෙටියෙන් දක්වන්න. (ල. 02)

iii. මෙවැනි අවස්ථාවක මතු විය හැකි බාධක වර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 03)

iv. මිතුරන් දෙදෙනා වෙන්වන අවස්ථාවේදී නැවත කතා බහ කිරීමට කතිකා කර ගත්හ. මෙහිදී ඔවුන්ට භාවිතා කළ හැකි සන්නිවේදන ක්‍රම හතරක් කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

(05)




i. ඉහත සූත්‍රය හඳුන්වන නම කුමක්ද? (ල. 01)

ii. මෙහි A,B,C හා D අංග හඳුන්වන්න. (ල. 02)

iii. සාර්ථක සන්නිවේදනයක් සිදුවීමට ප්‍රතිපෝෂණය ඉවහල් වේ. එමගින් ග්‍රාහකයාට ලැබෙන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03).

උත්තේජ ප්‍රතිචාර ක්‍රියාවලිය දැක්වෙන රූප සටහන ඇඳ උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(06) ඡායාරූප ශිල්පියකු වන ප්‍රියන්ත පුවත්පතක නිදහස් වාර්තාකරුවකු ලෙස ද කටයුතු කරයි.

i. ඡායාරූප ගැනීම සඳහා යොදා ගන්නා කැමරා වර්ග දෙක නම් කරන්න. (ල. 01)

ii. විභේදන බලය යනුවෙන් කුමක් අදහස්වේද? (ල. 02)

iii. පුවත්පත් සඳහා ඡායාරූප යොදා ගැනීමෙන් ලැබෙන වාසි තුනක් සඳහන් කරන්න. (ල. 03)

iv. අංකික හෙවත් ඩිජිටල් ඡායාරූපකරණයේ ඇති විශේෂතා 4 ක් විස්තර කරන්න. (ල. 04)

(07)

i. ප්‍රවෘත්තියක විස්වසනීයත්වය පිළිබඳ සරල සමීකරණයක් ඉදිරිපත් කළ විශේෂඥයා කවුද? (ල. 01)

ii. ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේද දෙක නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

iii. ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා යොදා ගන්නා ආකෘතිය කුමක්ද? ඒහි රූප සටහනක් අඳින්න. (ල. 03)

iv. තොරතුරු රැස් කර ගැනීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර 4 ක් නම් කර විස්තර කරන්න. (ල. 04)

# පළමු වාර පරීක්ෂණය - 2019
# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II
# 11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

01.

i. සමූහ සන්නිවේදනය

ii. ග්‍රාහකයන් හා සන්නිවේදකයා සම්මුව වීම

iii.
* ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතය
* කාය භාෂාව භාවිතය
* උපකරණ භාවිත කිරීම
* ප්‍රශ්න ඇසීම

iv.
* හඬ පාලනය
* අක්ෂි සබඳතා පවත්වා ගැනීම
* සංවාදාත්මක ස්වරයක් යොදා ගැනීම
* ග්‍රාහක ප්‍රතිචාර නිරීක්ෂණය
* කාලය පිළිබඳ සැලකිලිමත් වීම

v.
* ලිඛිත සන්නිවේදනය
* වාචික සන්නිවේදනය
* ශ්‍රව්‍ය සන්නිවේදනය
* දෘශ්‍ය සන්නිවේදනය

vi.
* නිශ්චිත අරමුණක් තිබීම
* නිශ්චිත වේලාවක් තිබීම
* පූර්ව සැලැස්මක් තිබීම
* නිශ්චිත ග්‍රාහක පිරිසක් සිටීම
* නිශ්චිත න්‍යාය පත්‍රයක් තිබීම.

vii.
* තොරතුරු සැපයීම
* අධ්‍යාපනය ලබා දීම
* පෙළඹවීම
* සංවාද හා සාකච්ඡා

viii.
* තනි දාමය
* ඕපාදූප දාමය
* සම්භාවිතා දාමය
* පර්ෂද දාමය

ix.
* ගුවන් විදුලිය
* රූපවාහිනිය

x.
* ගුවන් විදුලිය - ශ්‍රාවකයා
* රූපවාහිනිය - ප්‍රේක්ෂකයා
* පුවත්පත - පාඨකයා

(02)

i. අභිසාරී මාධ්‍ය

ii.
* දුම් ගැසීම
* කොළ අතු එල්ලීම
* පුවත්පත - පාඨකයා
* කොඩි එල්ලීම

iii.
* සන්දේශ පොදු වීම
* සන්නිවේදකයා හා ග්‍රාහකයා සම්මුඛ නොවීම
* ඒක වාර්ගික වීම

*        තාක්ෂණික උපකරණ භාවිතය
*        ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වීම

         (කරුණු තුනක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුයි.)

iv    සන්දේශයක් ග්‍රාහකගත වීමේදී කිසියම් වෙනසකට ලක් කිරීම දොරටුපාල සංකල්පයයි.

*        සන්දේශ ප්‍රමිතියෙන් තොර වීම
*        කාලය ප්‍රමාණවත් නොවීම
*        මාධ්‍ය ආයතන හිමිකරුගේ ප්‍රතිපත්ති හා විවිධ බලපෑම්
*        ආචාර ධර්මයන්ට පටහැනි වීම
*        පවතින සංස්කෘතියට පටහැනි වීම

(03)

i.    ෂැනොන් හා විවර් ආකෘතිය

ii.




iii.   *        පුද්ගලාන්තර සන්නිවේදනය
*        ජන සන්නිවේදනය
*        සමූහ සන්නිවේදනය

         (කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුයි)

iv.   සමානකම් :

*        ආකෘති දෙක ම රේඛීය වේ.
*

අසමානකම් :

*        ෂැනොන් හා විවර් ආකෘතියේ දී බාධක පිළිබඳ සඳහන් වුවද ලැස්වෙල් ආකෘතියේ බාධක පිළිබඳ සඳහන් නොවේ.
*        ෂැනොන් හා විවර් ආකෘතියේ සම්ප්‍රේෂකය පිළිබඳ සඳහන් වුවද ලැස්වෙල් ආකෘතියේ සම්ප්‍රේෂක පිළිබඳ සඳහන් නොවේ.

(04)

i.    අන්තර් පුද්ගල සන්නිවේදනය

ii.

*        ඇස් සම්බන්ධතාව
*        ස්පර්ශය
*        අභිනය
*        ඇඳුම් පැළඳුම්
*        අංග චලනය
*        ඉඟි
*        මුහුණේ ඉරියව්
*        සංඥා සංකේත

iii.   අර්ථ බාධක :

*        වචන අපහැදිලි වීම
*        අංගචලන ක්‍රම අපහැදිලි වීම
*        උච්ඡාරණය පිළිබඳ ගැටලු
*        ප්‍රාදේශීයය ව්‍යවහාර නොවැටහීම

iv. දුරකථන භාවිතය

කෙටි පණිවිඩ

විද්‍යුත් තැපෑල

Skype - මඟින් (කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුයි)

(05)

i. ද්වි වාර්ගික සන්නිවේදන සූත්‍රය

ii. A - මාධ්‍යය

B- ග්‍රාහකයා

C- සන්දේශය

D- ප්‍රතිපෝෂණය

iii. * අපහැදිලි නොතේරුනු තැන් පැහැදිලි කර ගැනීම.

* සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර අන්තර් සබඳතාවක් පවත්වාගෙන යාම.

* නිවැරදිව ග්‍රාහකයාට පණිවිඩය ලැබුණේදැයි දැන ගැනීම.

* සාර්ථකව සන්නිවේදන කාර්යයන් සිදු කිරීමට.

(කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුයි.)

iv.




(උදාහරණයක් ඇසුරින් මෙම ක්‍රියාවලිය පැහැදිලි කර තිබිය යුතුයි.)

(06)

i. සේයා පටල යොදන කැමරා

ඩිජිටල් කැමරා

ii. වර්ග අඟලක් තුල පවතින පික්සල් සංඛ්‍යාව.

iii. ග්‍රාහක ආකර්ශනය ලබාගත හැකි වීම.

අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට හැකිවීම.

තාත්වික බව.

ග්‍රාහක විශ්වාසනීයත්වය දිනාගත හැකි වීම.

iv. සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

(07)

i. පෝල් ඩී. මැසෙනියර්

ii. දෘඪ පුවත්, මෘදු පුවත්

iii. සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

iv. පුද්ගල මූලාශ්‍ර, ආයතනික මූලාශ්‍ර, ලිඛිත මූලාශ්‍ර, මාධ්‍ය මූලාශ්‍ර විස්තර කිරීම.